# CYBER GUARDIAN

PUBLICATIN FOR YOUR ONLINE SAFETY

13 වැනි දිගහැරුම නොවැම්බර් 2025

SRI LANKA CERT|CC
Sri Lanka Computer Emergency Readiness Team





## සයිබර් ඔරොත්තු දීමේ හැකියාව සඳහා ශ්‍රී ලංකාවේ ඇති ඒකාබද්ධ කැපවීම වාර්ෂික සමුළුවේදී විදහා දැක්වෙයි

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT), ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ එක්ව 2025 නොවැම්බර් මස 12 වන දින බත්තරමුල්ලේ වෝටර්ස් එජ් හෝටලයේදී 16 වන ජාතික සයිබර් ආරක්ෂණ සමුළුව සාර්ථකව පවත්වන ලදී. "විශ්වාසනීය සහ සයිබර් ඔරොත්තු දෙන ජාතියක් ගොඩනැගීම" යන තේමාව යටතේ පැවති මෙම සමුළුවට රජය, පෞද්ගලික අංශය, ශාස්ත්‍රීය, කර්මාන්ත සහ සිවිල් සමාජය නියෝජනය කරමින් 400 කට අධික පිරිසක් සහභාගී වුහ.

''ප්‍රතිපත්ති හැඩගැස්වීම, භාවිතයන් සක්‍රීය කිරීම සහ ජාතික ප්‍රතිචාර ධාරිතාව ශක්තිමත් කිරීම'' යනාදිය කෙරෙහි මෙවර සමුළුවේදී අවධානය යොමු විය. ඉහළ යන සයිබර් තර්ජන හමුවේ, ඩිජිටල් විශ්වාසය ඉදිරියට ගෙන යාම, සයිබර් සූදානම ශක්තිමත් කිරීම සහ ජාතික ඔරොත්තු දීමේ හැකියාව සුපෝෂණය කිරීම සඳහා රට තුළ ඇති කැපවීම එමගින් පෙන්නුම් කෙරිණ.

ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම, මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ අනාගතයට වගකීම් සහගත ඩිජිටල් නවෝත්පාදනයන් හැඩගැස්වීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන බහු පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමෙහිලා මෙම සමුළුව සුවිශේෂී ඉදිරි පියවරක් සනිටුහන් කළේය.

## විශේෂ ආරාධිතයින් රැසක් සමුළුව අමතයි.

ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය, ඉංජිනේරු එරංග වීරරත්න මහතා සමුළුවේදී අදහස් දක්වමින් ඩිජිටල් පද්ධති කෙරෙහි මහජන විශ්වාසයේ වැදගත්කම පෙන්වා දුන් අතර සමුළුවේ සමාරම්භක දේශනය සිදුකළ අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වරුණ ශ්‍රී ධනපාල මහතා ආර්ථික වර්ධනයේ සහ ගෝලීය තරගකාරිත්වයේ ධාවකයක් ලෙස සයිබර් ආරක්ෂාවේ වැදගත්කම අවධාරණය කළේය. සමුළුවට සහභාගී වූ පිරිස නිල වශයෙන් පිළිගත්තේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සභාපති තිලක් පතිරගේ මහතා විසිනි.



ඩිජිටල් ආර්ථිකය පිළිබඳ ජනාධිපති ප්‍රධාන උපදේශක සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සභාපති ආචාර්ය හාන්ස් විජයසූරිය මහතා සහ FIRST.Org හි විධායක අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ක්‍රිස් ගිබ්සන් මහතා ඇතුළු කැපී පෙනෙන ආරාධිත කථිකයෝ ගණනාවක් මෙම සමුළුවට සහභාගී වුහ. ඔවුන්ගේ දේශන මගින් වගවීම ශක්තිමත් කිරීම, අන්තර් අංශ සම්බන්ධීකරණය සහ ජාතික සිදුවීම් ප්‍රතිචාර ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා ඇති අවශ්‍යතාවය ඉස්මතු කරන ලදී.

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය කණිෂ්ක කරුණාසේන මහතා, ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වන අලුත්ම තත්වය විස්තර කල අතර, සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වූ ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ ටකෆුමි කඩෝනෝ මහතා ජාතික සූදානම හැඩගැස්වීමෙහිලා ගෝලීය සයිබර් ආරක්ෂණ ප්‍රවණතා පිළිබඳව සාකච්ඡා කළේය.



## FIRST.Org හි විධායක අධ්‍යක්ෂවරයා (CERT) කාර්යාලයේ සංචාරයක නිරත වෙයි

FIRST.Org හි විධායක අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ක්‍රිස් ගිබ්සන් මහතා පසුගිය නොවැම්බර් මස 14 වන දා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසද (SLCERT) කාර්යාලයේ සංචාරයක නිරත විය. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටා ඇති එම කාර්යාලයට පැමිණි ගිබ්සන් මහතා SLCERT කණ්ඩායමේ ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක් කළේය. ඒ මහතා SLCERT කාර්යාලයේ සංචාරයේ නිරත වුයේ ශ්‍රී ලංකාවේ පැවති ජාතික සයිබර් ආරක්ෂණ සමුළුවට සහභාගීවීමට දිවයිනට පැමිණි අතරතුර දීය

# නුවරඑළියේ පොලිස් නිලධාරීන් 200 දෙනෙකුට සයිබර් අපරාධ වැළැක්වීමේ පුහුණුව

නුවරඑළිය සහ හැටන් කොට්ඨාශවල සේවයේ නිරත පොලිස් නිලධාරීන් 200කට ආසන්න පිරිසක් අන්තර්ජාල අපරාධ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ දෙදින තීව්‍ර පුහුණු වැඩසටහනකට නොබෝදා සහභාගී වූහ. මතුවෙමින් පවතින සයිබර් තර්ජනවලට මුහුණ දීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කර පවත්වන ලද්දේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SriLanka CERT) විසිනි.



සමාජ මාධ්‍ය ආශ්‍රිත අපරාධ ඩිජිටල් සාක්ෂි හැසිරවීම සහ සයිබර් සිද්ධීන්ට අදාළ විමර්ශනවල හොඳම භාවිතයන් වැනි තීරණාත්මක ක්ෂේත්‍ර ගණනාවක් මෙහිදී පැවති පුහුණු සැසිවලදී විශේෂ අවධානයට ලක්විය. සැබෑ තත්වයන්හිදී ඔවුන්ගේ ක්ෂේත්‍රවල නිලධාරීන්ට ලැබුණු අත්දැකීම් තුලින් ලබාගත් දැනුම බෙදා ගැනීමට ද එහිදී අවස්ථාව ලබා දුන් අතර එමඟින් වටිනා ප්‍රායෝගික දැනුම හුවමාරුවක් ඇති විය.නවීන සයිබර් අභියෝගවලට මුහුණ දීමේදී සහ මහජනතාව මාර්ගගත අපරාධවලින් ආරක්ෂා කිරීමේදී පොලිස් නිලධාරීන්ගේ සූදානම සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීමට මෙම වැඩසටහන රුකුලක් වනු ඇතැයි සංවිධායකයෝ අපේක්ෂා කරති.






# රජයේ මූල්‍ය ප්‍රදාන දිනූ බවට ලැබෙන පණිවිඩවලින් වළකින්න

රජයේ ආයතනවල නිලධාරීන් ලෙස පෙනී සිටින වංචනිකයන්ගෙන් බොහෝ පුද්ගලයින්ට පණිවිඩ ලැබීමට පටන් ගෙන තිබේ. මෙම වංචාකරුවන් විසින් පණිවිඩ ලබන්නන්ට, ඔවුන් මූල්‍ය ත්‍යාගයක් දිනා ඇති බවට ඒත්තු ගන්වන අතර එම ත්‍යාගය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පුද්ගලික තොරතුරු විශේෂිත සබැඳියක් හරහා තමන් වෙත ලබාගැනීමට ක්‍රියා කරයි.

බැංකු ගිණුම් තොරතුරු සහ එක් වරක් පමණක් භාවිතා කරන රහස්‍ය කේත අංක (OTP) ඇතුළු පුද්ගලික තොරතුරු ලබා ගැනීමෙන් පසු මෙම වංචාකරුවන් එම අයගේ ගිණුම්වලින් මුදල් සොරකම් කරති.

රාජ්‍ය ආයතනයකින් මූල්‍ය සම්මානයක් දිනා ඇති බවට පවසන ඕනෑම පණිවිඩයකට ප්‍රතිචාර දැක්වීමෙන් සහ තමන්ගේ පුද්ගලික තොරතුරු බෙදා ගැනීමෙන් වළකින ලෙස අපි මහජනතාවගෙන් ඉල්ලා සිටිමු.

# ආපදා සහන සේවා වංචාවන්ගෙන් පරිස්සම් වන්න

ශ්‍රී ලංකාව මුහුණ දුන් විශාලතම හා වඩාත්ම ව්‍යසනකාරී ස්වාභාවික විපතින් පසු, වංචනිකයින් කිහිප දෙනෙකුම වින්දිතයින් සඳහා පරිත්‍යාග ලබා ගන්නා මුවාවෙන් මහජනතාවගෙන් මුදල් එකතු කිරීමට පටන් ගෙන තිබේ.

වංචාකරුවන් සිය පුද්ගලික වාසි සඳහා මෙම ඛේදවාචකය යොදාගන්නා බැවින්පරිත්‍යාග සිදුකිරීමට පෙර ප්‍රවේශම් සහගත වන ලෙසත්, සියලු සහන ඉල්ලීම් ගැන සොයා බලා කටයුතු කරන ලෙසත් බලධාරීන් මහජනතාවගෙන් ඉල්ලා සිටී.

# ශ්‍රී ලංකා නැවත ගොඩනැංවීමේ අරමුදල

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ සිදු වූ දරුණුතම ස්වාභාවික ව්‍යසනයන්ගෙන් එකක් වන දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බිහිසුණු විනාශයෙන් පසු රට නැවත ගොඩනැගීම අරමුණු කරගත් නැවත ගොඩනැංවීමේ, ශ්‍රී ලංකා අරමුදල (Rebuilding Sri Lanka Fund) පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත. මෙම අරමුදල ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස ස්ථාපිත කිරීමට නියමිත අතර, එහි කළමනාකරණ කමිටුව වාණිජ හා රාජ්‍ය අංශවල නියෝජිතයින්ගෙන් සමන්විත වනු ඇත.

ගිණුම් නාමය: භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
ගිණුම් අංකය: 2026450
බැංකුව: ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාව
SWIFT කේතය: BCEYLKLX